සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 6 - 2019

නම : ............................................. **නර්තනය** කාලය : පැය 02 යි.

වැදගත් :

- **සියලු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**

- **අංක 01-05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

## I කොටස

(1) 'ඔවා ද සිප්ප දානේන'................................. මෙය,
1. මා පිය වන්දනා කවියකි. 2. ගැමි ගායනයකි.
3. ගුරු නමස්කාරයකි. 4. කළගෙඩි කවි ගායනයකි.

(2) උඩරට සම්ප්‍රදායේ ගොඩසරඹ වල දෙවන සරඹයේ කස්තිරම වන්නේ,
1. තත් ජිත් තොං නම් තා
2. තත් ජිත් තක ජිත් තත් ජිත් තොං නං තා
3. තරිකිට ජිත් තරිකිට දොම්කිට තා
4. තෙයි තෙයි තත් තත් තාම්

(3) තෛපොංගල් උත්සවයේ දක්නට ඇති සැරසිල්ලක් වන්නේ,
1. කෝලම් රටාය 2. ගොක්කොළ නෙළුම් මලය.
3. පහන් කූඩු 4. විදුලි බුබුළු

(4) 'මගේ පොඩි යාලු'................................. මෙම ගීතය රචනා කළේ,
1. හර්ෂණ දිසානායක 2. බෙනඩික් ප්‍රනාන්දු
3. ආනන්ද සමරකෝන් 4. මහාචාර්ය සුනිල් ආරියරත්න

(5) 'වෛශාක්‍ය මංගල්‍යය' නමින් හැඳින්වෙන්නේ,
1. නත්තල් උත්සවයයි. 2. වෙසක් උත්සවයයි.
3. පොසොන් උත්සවයයි. 4. තෛපොංගල් උත්සවයයි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල ඇතුළත් වගන්තිවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**
**(අංග, ප්‍රත්‍යාංග, උපාංග/ සිරිබෝහාමි මහතා/ කළගුණ සැලකීම / තුනකි/ සුලු තනි තිත)**

(6) නත්තල් උත්සවයේ පැහැදිලිවන ගුණධර්මයකි.

(7) තනි තිතේ ප්‍රභේද ගණනින් ..................................................

(8) නර්තනයේ දී සිරුර බෙදෙන ප්‍රධාන කොටස් තුන ........................................................ වේ.

(9) උඩරට හනුමා වන්නම ..................................................................ට නර්තනය කරනු ලබයි.

(10) ........................................................ මහතා සබරගමු නැටුම් සම්ප්‍රදාය පිළිබඳ දක්ෂ නර්තන ශිල්පියෙකි.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා වගන්ති නිවැරදි නම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් ( ✕ ) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(11) සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය උපකරණ උපයෝගී කර ගනිමින්
දුම්රියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමූහ වාදනයක් ඉදිරිපත් කල හැකිය. (...................)

(12) ගාල්ල හා මාතර සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වේ. (...................)

(13) ගොප්කොළ යොදා ගනිමින් පහසුවෙන් ගත හැකි නිර්මාණයකි, ගොප්කොළ නළාව (...................)

(14) සත්ව චරිත නිර්මාණයේ දී ඒ ඒ චරිතවලට අනන්‍ය වූ සුවිශේෂ ලක්ෂණ ඇසුරු කරගත යුතුය. (...................)

(15) ''කෝලාට්ටම්'' යනු ලී කෙළි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි. (...................)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| (16) | පහතරට නර්තන සම්ප්‍රදාය | සෙම්බු නැටුම |
| (17) | ද්‍රවිඩ ගැමි නැටුමකි. | එස්. එච්. සවුරිස් සිල්වා |
| (18) | බෙත්ලෙහෙම | මතින් උඩගු සිත ගතින් වැඩිව පෙර |
| (19) | පහත රට බෙරය | ජේසු උපත |
| (20) | හනුමා වන්නම | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ |

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) 1. පළමු ගොඩ සරඹයේ සරඹ නාමය ලියන්න. (ලකුණු 02)

2. හනුමා වන්නමේ බෙර පදය ලියන්න. (ලකුණු 02)

3. වෙස් ඇදුම් කට්ටලය අයත් නර්තන සම්ප්‍රදාය කුමක් ද? (ලකුණු 02)

4. නර්තනයේ දී භාවිත කරන චලන වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

5. සුළු තනි තිතට අයත් මාත්‍රා ගණන ලියන්න. (ලකුණු 02)

(02) 1. ඔබ පංති කාමරයේ දී ඉගෙන ගෙන ඇති දේශීය නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙක් නම් කරන්න. (ලකුණු 05)

2. ඔබ නම් කල ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(03) 1. සමන් දේවාල පෙරහැරේ දක්නට ලැබෙන නර්තන අංග හතරක් නම් කරන්න. (ලකුණු 05)

2. පෙරහැර සංචාරය කරන දේවාල භූමියේ ඇති වීථි පහ ලියන්න. (ලකුණු 05)

(04) 1. ඔබ කැමති ගැමි නැටුම් තුනක් නම් කර ඒ සඳහා භාවිත කරන රංග උපකරණ වෙන වෙනම ලියන්න. (ලකුණු 05)

2. කලගෙඩි නැටුමට අදාල කවියක් ලියන්න. (ලකුණු 05)

(05) 1. තනි තිතේ ප්‍රභේද නම් කර 'කුද ගත ගත දොම්' බෙරපදය සුලු තනි තිතට ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)


2. ප්‍රස්තාරකරණයේ දී භාවිතා කරන තාල සංකල්ප තුනක් නම් කර ඊට අදාල සංකේත තුන ලියා දක්වන්න. (ලකුණු 05)

(06) හරහට

1. සමන් දේවාල පෙරහැරේ පවත්වන පළමු චාරිත්‍ර විධියයි.
2. ප්‍රස්තාරකරණයේ දී යොදාගනු ලබන සංකේතයකි.
3. නර්තනයේ මූලික අංගහාරයයි.

පහළට

1. ගොඩ සරඹ අවසන් කරන පද කොටසකි.
2. සමන් දේවාල පෙරහැරේ දැකිය හැකි සුවිශේෂී අංගයකි.



**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 6 - 2019

### නර්තනය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 06. | කළගුණ සැලකීම | 11. | ◀ | 16. | එස්. එච්. සවිරිස් සිල්වා මහතා |
| 02. | 2 | 07. | තුනකි | 12. | ▲ | 17. | සෙම්බු නැටුම |
| 03. | 1 | 08. | අංග, ප්‍රත්‍යාංග, උපාංග | 13. | ◀ | 18. | ජේසු උපත |
| 04. | 4 | 09. | සුලු තනි තිත | 14. | ◀ | 19. | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ |
| 05. | 2 | 10. | සිරිබෝ හාමි මහතා | 15. | ◀ | 20. | මතින් උඩඟු සිත ගතින් වැඩිව පෙර |

(ලකුණු 01 x 20)

### II කොටස

01. (1) පළමු අඩිය (ලකුණු 02)
(2) කුද ගත ගත දොම් (ලකුණු 02)
(3) උඩරට නර්තන සම්ප්‍රදාය (ලකුණු 02)
(4) ස්ථිතික චලන හා සංචාරී චලන (ලකුණු 02)
(5) මාත්‍රා 2කි. 12/12 (ලකුණු 02)

02. (1) තිත්තවෙල ගුණයා ගුරුතුමා
එන්. ඒ. සිරිබෝ හාමි ගුරුතුමා
එස්. එච්. සවුරිස් සිල්වා ගුරුතුමා
යන අයගෙන් එක් අයෙකු නම් කර ඇත්නම් (ලකුණු 04)
(2) නම් කරන ලද ශිල්පියා පිළිබඳ අදාල විස්තර ලියා ඇත්නම් (ලකුණු 06)

03. (1)
(1) උඩරට, පහතරට, සබරගමු නැටුම්
(2) පන්තේරු හා උඩැක්කි නැටුම්
(3) ජන නැටුම්
(4) රතේ නැටුම (අතිරේක පොතේ සඳහන් පරිදි)
(5) දෙවොල් හා වඩිග පටුන යන ඒවායින් 4ක් ඇත්නම් (ලකුණු 05)

(2)
(1) උඩ වීදිය
(2) කුඹල් වීදිය
(3) ගම්පහ වීදිය
(4) හුණුවල වීදිය
(5) සංහිදේ වීදිය (ලකුණු 05)

04. (1) කළගෙඩි නැටුම කළගෙඩි
ලී කෙලි නැටුම ලී දෙකක්
කුලු නැටුම කුල්ල
තාලම් නැටුම තාලම්පට
යනා දී වශයෙන් 3ක් ලියා ඇත්නම් (ලකුණු 05)

(2) ඊට අදාළ කවියක් ලියා ඇත්නම් (ලකුණු 05)

05. (1) සුලු තනි තිත, මැදුම් තනි තිත, මහ තනි තිත

| 1́ | 2 | 1́ | 2 | 1́ | 2 | 1́ | 2 |
|---|---|---|---|---|---|---|---|
| කු | ද | ග | ත | ග | ත | දොම් | |

(ලකුණු 05)

(2) තිත් ^
තෙයි /
කෙටි ඉර -
අවග්‍රහය +
ඇදය ◡ මේවායින් තුනක් සඳහන් කර ඇත්නම්, (ලකුණු 05)

06. හරහට
1. කප් සිටුවීම
2. තිත්
3. මණ්ඩිය

පහළට
1. කස්තිරම
2. මහ බඹා (1 x 2 බැගින් ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

01. (1) කැමති ගායනයක් (ලකුණු 05)
 (2) ගුරුවරයා විසින් නම් කරන ලද ගායනයක් (ලකුණු 05)

02. (1) ✦ පා සරඹ 2, 3 නැටීම (ගුරුවරයා නම් කරන ලද පා සරඹයක් නැටීම) (ලකුණු 05)
 ✦ හමාර පදය නැටීම.
 (2) ගොඩ සරඹ 2 නැටීම.
 කස්තිරම නැටීම. (ලකුණු 05)

03. (1) හනුමා වන්නමේ කවියකට පද දෙකක් නර්තනය කරවීම. (ලකුණු 05)
 (2) කස්තිරම නැටීම (ලකුණු 05)

04. (1) ලී කෙලි නර්තනයක් ඉදිරිපත් කිරීම. (ලකුණු 10)

05. සත්ව චරිතයක ගමන් විලාසක් ඉදිරිපත් කිරීම.
 - ඉබ්බෙක් ගමනක් යයි. ශබ්දයක් ඇසී ආරක්ෂා වෙමින් ගමන නතර කරයි. නැවත ගමනේ යයි.
 - අශ්වයෙක් ඉතා සෙමෙන් ගමන් කරමින් සිට හදිසියේ ම වේගයෙන් දිවයයි, නැවතත් වේගය අඩු කරමින් ගමන් කරයි.
 - අලියකු පෙරහැරේ යයි. බෙර නාදයට පාද තබන අලියා සතුටින් නටයි. අසල ඇති ගසක් ලඟ නැවතී කොළ කඩා කයි. නැවත ගමන් කරයි.

 (ගුරුවරයාට අභිමත පරිදි ඉදිරිපත් කරවීම.) (ලකුණු 10)